**පොලිස් ත්‍යාග අරමුදල - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

පොලිස් ත්‍යාග අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය , ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මූල්‍ය ප්‍රකාශන අනුව වාර්ෂික දඩ මුදල් ලැබීම් ආදායම සහ විගණනය විසින් ඍජුවම අධිකරණ තුනකින් කැඳවා තිබූ වාර්ෂික උසාවි දඩ මුදල් ආදායම් අතර රු.891,502 ක වෙනසක් පැවතුණි. | මූතූර් අධිකරණයේ චෙක්පත හා කොට්ඨාශ වාර්තා අතර වෙනස්කම් පවතීනම් ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. සෙසු අධිකරණ දෙකෙහි රු.429,168 ක වෙනස 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරමි. | නොසැසඳීම් පරීක්ෂාකර හේතු හඳුනාගත යුතුය. |
| (ආ) 2021 දෙසැම්බර් 31 දිනට තැපැල් දෙපාර්තමේන්තු වෙන් ලැබිය යුතු රු. 137,800 ක රථවාහන දඩ මුදල් ආදායමක් ගිණුම් වල සටහන් කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ජනල් සටහන් මගින් 2021 වර්ෂයේ ප්‍රකාශිත රථවාහන දඩමුදල් ආදායමට ගැලපීම් සිදුකර නිවැරදි කිරීමට කටයුතු කරමි. | වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීම. |
| (ඇ) 2021 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් වාර්තාවේ අභරු චෙක්පත් ලෙස හඳුනාගෙන තිබූ රු.1,267,196 ක් සම්බන්ධයෙන් ගැලපීම් සිදු කර නොතිබුණි. | අගරු චෙක්පත් සඳහා හිලව් චෙක්පතක් එවන ලෙස දැනුම් දී ඇත. ඉදිරියේදී එම චෙක්පත වෙනුවට හිලව් චෙක්පතක් ලැබුණු පසු බැංකු සැසඳුම තුල අදාල ගැලපීම සිදුකරන බව දැනුම් දෙමි. | අගරු චෙක්පත් වටිනාකම නිරවුල් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396 | 2021 දෙසැම්බර් 31 දිනට නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවා ඇති රු.541,250 ක් වටිනා චෙක්පත් 57 ක් සම්බන්ධයෙන් අදාල කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධව අදාල ගැලපීම් සිදුකරමි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.7 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය බුද්ධි සේවාව සඳහා සාමාන්‍ය අග්‍රිමය යටතේ 2021 පෙබරවාරි 17 දිනැතිව ලබා දී තිබූ රු.2,500,000 ක මුදල ඉක්මවා බෝඹුරු ඇල්ල පුහුණු පාසල ඉදිකිරීමට ලබාදුන් මුදලින් රු.1,902,305 ක් ඇතුළත්ව රු.4,402,305 ක් ත්‍යාග ගෙවීම් සඳහා වැයකර තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ගිණුම්ගත කර ඇත. | අනුමත අග්‍රිම සීමාව යටතේ වියදම් දැරීමට පොලිස් කොට්ඨාශ කටයුතු කල යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,423,128,814 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,487,969,210 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.64,840,396 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.296,630,794 ක් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

කොරෝනා වෛරසය මැඩ පැවැත්වීම හා මර්දනය කිරිම වෙනුවෙන් ඍජුව මැදිහත් වී එම වෛරසය ආසාධිත වීම හෝ වෛරසයේ ආසාධිතයන්ගේ ආශ්‍රිතයන් වීම මත නිරෝධානයට යොමු කරන ලද පොලිස් නිලධාරින්ට සුභසාධනය සැලසීම සඳහා රු. 5,000 මූල්‍ය සීමාවකට යටත්ව වියළි ආහාර මලු ලබා දීම සඳහා පොලිස් කොට්ඨාශ 37 ක් සඳහා රු. 104,288,491 ක් ගෙවා තිබීම හා රාජ්‍ය බුද්ධි සේවාව මඟින් ප්‍රාදේශීය පොලිස් ස්ථානයන්හි බුද්ධි රාජකාරි සහ පොලිස් විශේෂ කාර්යාංශයේ රාජකාරිවල නිරතව සිටින නිලධාරින් සඳහා විශේෂ බුද්ධි පුහුණු පාඨමාලාවන් පැවැත්වීම සඳහා නුවරඑළිය බෝඹුරුඇල්ල පුහුණු පාසලෙහි ස්ථිර ඉදිකිරීම සඳහා රු. මිලියන 19,888,781 ක් වැය කිරීම සුභසාධක කටයුතු යටතේ වූ රු.125,823,598 වියදම තුල ඇතුලත්ව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට අධිකරණ 05 ක් විසින් ත්‍යාග අරමුදලට ලබාදිය යුතු එකතුව රු.14,943,229 ක් වූ ත්‍යාග මුදල් දිගු කාලයක සිට ප්‍රමාද වෙමින් පැවති අතර එම ප්‍රමාදය මාස 05 සිට මාස 15 ක් දක්වා වූ පරාසයක පැවතුණි. | 2022 වර්ෂයේදී චෙක්පත් ගෙන්වා ගැනීමට කටයුතු කරමින් පවතී. | පොලිස් ත්‍යාග අරමුදලට ලැබිය යුතු ආදායම් නොපමාව රැස් කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රථවාහන උපදෙස් චක්‍රලේඛ අංක 149/2019 අනුව බීමත්ව රිය ධාවනය නිසා මහජනතාවට සිදුවන හානි දුරු කිරීම අත්‍යවශ්‍ය කරුණක් ලෙස හඳුනාගෙන එවැනි වැටලීම් සිදුකරන පොලිස් නිලධාරීන් දිරි ගැන්වීම සඳහා ත්‍යාග මුදල් ගෙවීමට තීරණය කර තිබුණි. 2021 වර්ෂයේදී පොලිස් කොට්ඨාශ 11 කට අයත් පොලිස් ස්ථාන 32 ක් බීමත් රියදුරන් 4,090 ක් අත්අඩංගුවට ගෙන තිබුණද, එම අත් අඩංගුවට ගැනීමට සහභාගි වූ නිලධාරීන්ට කිසිදු ත්‍යාග මුදලක් ගෙවා නොතිබුණි. විගණනයට ලබාදී තිබූ තොරතුරු පිළිබඳ නියදි පරීක්ෂාවට අනුව ඉහත පොලිස් කොට්ඨාශ 11 හි සෙසු පොලිස් ස්ථානවල අදාල නිලධාරීන්ට ත්‍යාග මුදල් ගෙවා තිබුණි. මෙලෙස පොලිස් ස්ථාන කොටසකට ගෙවීමත් කොටසකට නොගෙවීමත් චක්‍රලේඛය මගින් අපේක්ෂිත අරමුණු ඉටුවීමට බාධාවක් වී තිබුණි. | බීමත් රියදුරන් අත්අඩංගුවට ගැනීම සඳහා ත්‍යාග මුදල් ගෙවීම සම්බන්ධව නිරීක්ෂණය වී ඇති කරුණු හා ඊට අදාල හේතූන් දක්වන ලෙස කොට්ඨාශ කාර්යාල වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රධාන ගණකාධිකාරි අත්සනින් යුතුව එක් එක් කාර්යාල වෙත ලිපි යවා ඇත. එම විමසීම් සඳහා පිළිතුරු ලද විගස දැනුම් දීමට කටයුතු කරමි. | චක්‍රලේඛයේ සඳහන් අපේක්ෂිත අරමුණු ඉටුවන අයුරින් හා නිලධාරීන් දිරිගැන්වීම සඳහා ත්‍යාග මුදල් ගෙවීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2021 වර්ෂයේදී බීමත් රියදුරන් අත්අඩංගුවට ගැනීම වෙනුවෙන් සෘජුවම සම්බන්ධ වන නිලධාරීන්ට ත්‍යාග මුදල් නොගෙවා ඒ වෙනුවෙන් පොලිස් ස්ථානාධිපතිවරුන්ට පමණක් රු.710,000 ක ත්‍යාග මුදල් ගෙවා තිබූ පොලිස් ස්ථාන 16 ක් විය. මෙම පොලිස් ස්ථාන 16 න් 14 ක් විසින් බීමත් රියදුරන් 1,219 ක් අත්අඩංගුවට ගෙන තිබූ අතර එකම බීමත් රියදුරෙක්වත් අත්අඩංගුවට නොගත් පොලිස් ස්ථාන 02 ක ස්ථානාධිපතිවරුන්ට රු.100,000 ක ත්‍යාග ලබා දී තිබුණි. | බීමත් රියදුරන් අත්අඩංගුවට ගැනීම සඳහා ත්‍යාග මුදල් ගෙවීම සම්බන්ධව නිරීක්ෂණය වී ඇති කරුණු හා ඊට අදාල හේතුන් දක්වන ලෙස කොට්ඨාශ කාර්යාල වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රධාන ගණකාධිකාරි අත්සනින් යුතුව එක් එක් කාර්යාල වෙත ලිපි යවා ඇත. එම විමසීම් සඳහා පිළිතුරු ලද විගස දැනුම් දීමට කටයුතු කරමි. | චක්‍රලේඛයේ සඳහන් අපේක්ෂිත අරමුණු ඉටුවන අයුරින් හා නිලධාරීන් දිරිගැන්වීම සඳහා ත්‍යාග මුදල් ගෙවීමට කටයුතු කල යුතුය. |

## 4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශේෂ ත්‍යාග වියදම් ලෙස රු. 100,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද වියදම රු. 21,168,250 ක් වූයෙන් අයවැය ඇස්තමේන්තුවට වඩා සියයට 79 ක් අඩුවෙන් වැය කර තිබුණි. | විශේෂ ත්‍යාග ගෙවීම පිළිබඳව නිවැරදි පුරෝකථනයක් සිදු කල නොහැකි අතර එක් එක් කාල වකවානු තුල ඇති වන සිද්ධි මත විශේෂ ත්‍යාග ගෙවන බව කාරුණිකව දැනුම් දෙමි. | අයවැයගත ඉලක්ක ඉටුකර ගැනීමට කටයුතු කල යුතු ය. |